**ශීර්ෂය - 149 කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 08 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් කර තිබූ නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශනයේ සිංහල පරිවර්තනයේ පිටු අංක 24 හි මුළු පුනරාවර්තන වියදම් වල එකතුව යටතේ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන එකතුව වූ රු. 4,248,000 ක මුදල හා මුදල් රෙගුලාසි 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් තීරුවේ එකතුව වූ රු. 31,381,575 ක මුදල දෙමළ පරිවර්තනයේ 104 පිටුවෙහි දක්වා නොතිබුණි. | භාෂාත්‍රයෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ඒ ඒ මූල්‍ය ප්‍රකාශ එකිනෙකට සැසඳිය යුතු බව. | 2019 ගිණුමේ මුද්‍රණ අඩුපාඩු සකස්කර ඉදිරියේදී නැවත ඉදිරිපත් කරමි. |
| (ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු ඒ සී ඒ 2 (ii) ආකෘතියේ දෙමළ පරිවර්තනයේ රාජ්‍ය ආයෝජනයන්හි මුළු වියදම් වල පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු. 3,039,742,000 ක් විය යුතු වුවද එය රු. 3,043,990,000 ක් ලෙස දක්වා තිබුණි. එසේම සිංහල පිටපතේ මුළු වියදම් වල එකතුව රු. 4,329,647,343 ක් ලෙස දක්වා තිබුණද ඉංග්‍රීසි හා දෙමළ පරිවර්තනවල එම වටිනාකම රු. 4,538,024,069 ක් ලෙස දක්වා තිබුණි. | භාෂාත්‍රයෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ඒ ඒ මූල්‍ය ප්‍රකාශ එකිනෙකට සැසඳිය යුතු බව. | 2019 ගිණුමේ මුද්‍රණ අඩුපාඩු සකස් කර ඉදිරියේදී නැවත ඉදිරිපත් කරමි. |

## 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ------------------------ |
| (අ) | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් රු. 61,768,883 ක් වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි එය රු. 56,104,189 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. | 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය පිළියෙල කිරීමේදී ආදායම් නොවන ලැබීම් ලෙස හඳුනාගෙන ඇති රු.61,768,883 ක වටිනාකම ඒ.සී.ඒ. 03 ආකෘතියේ තොරතුරු සැලකිල්ලට ගෙන සකසා ඇත. |
| (ආ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි මූලධන වියදම් යටතේ සටහන් කර තිබූ රු. 2,830,933,996 ක් වූ ප්‍රාග්ධන මාරුකිරීම් වටිනාකම තුල ඇතුලත් අංක 149-1-2-13-2202 දරන වැය විෂයයට අදාල මුළු වියදම රු.192,503,470 ක් ලෙස දක්වා තිබුණද එය අවසාන භාණ්ඩාගාර මුද්‍රිත සමඟ සැසඳීමේදී රු. 193,670,229 ක් විය යුතු බව නිරීක්ෂණය විය. ඒ අනුව රු.1,166,760 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි වටිනාකම් ඇතුලත් කළ යුතු වීම. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ මූලධන වියදම් යටතේ සටහන් කර තිබූ රු.2,830,933,906 ක වටිනාකම තුල ඇතුලත් 149-1-2-13-2202 වැය විෂයට අදාල මුළු වියදම මුද්‍රණය කිරීමේදී වැරදීමකින් අඩුවෙන් සඳහන් කර ඇත. |

## 1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අත්තිකාරම් ගිණුම්වල වටිනාකමින් තැන්පතු ගිණුම් වල වටිනාකම් අඩු කිරීමෙන් එන වටිනාකම රු. 10,406,807 ක ධන අගයක් විය.එම වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ශුද්ධ වත්කම් /ස්කන්ධය ලෙස වාර්තා කළ යුතු වුවද එය රු. 9,932,442 ක සෘණ අගයක් ලෙස වාර්තා කිරීම හේතුවෙන් වත්කම් හා වගකීම් අතර රු. 19,864,885 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගිණුම් වලට ඇතුලත් කළ යුතු වටිනාකම් නිවැරදිව හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ ශුද්ධ වත්කම් අගය අත්තිකාරම් ගිණුම්වලින් තැන්පතු ගිණුම් වල වටිනාකම අඩු කල පසු එය අමාත්‍යාංශය විසින් භාණ්ඩාගාරයට පියවිය යුතු ධන අගයක් විය යුතුය. නමුත් එම අගය මුද්‍රණය කිරීමේදී වැරදීමකින් සෘණ අගයක් ලෙස සඳහන් කර ඇත. |
| (ආ) | භාණ්ඩාගාර මුද්‍රිත අනුව 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්හි මුළු වටිනාකම රු.1,614,530,605 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම රු. 1,661,196,687 ක් වූයෙන් රු.46,666,082 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි වටිනාකම් ඇතුලත් කළ යුතු වීම. | අදාල වෙනස්කම් පිළිබඳව භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග පරීක්ෂා කිරීමේදී අනාවරණය වූයේ භාණ්ඩාගාර මුද්‍රිත හා අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් ඇතුලත් BOSS වාර්තාව සමග නොගැලපීම හේතුවෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් අදාල ගැලපීම සිදුකර ඇති බව හා එය නිවැරදි කිරීම සඳහා අදාල ජ'නලය අමාත්‍යාංශය විසින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත |

| | | | |
|---|---|---|---|
| | | | ඉදිරිපත් කල යුතු බව වේ. අදාල ගැලපීම් සදහා වන අදාල ජ‘නලය මෙම මස (2020 ජුනි) මාසික ගිණුම් සාරාංශ මගින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර එය නිවැරදි කිරීමට කටයුතු කඩිනමින් සිදු කරමි. |
| (ඇ) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවල 2018 දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශනවල ශේෂය හා 2019 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය අතර රු. 10,968,825 ක වෙනසක් නිරීක්ෂණය විය.එම වෙනස්කම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් හෙළිදරව් කළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් අදාල වටිනාකම් හෙළිදරව් කළ යුතු වීම. | භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ CIGAS වැඩසටහන මෙහෙයවන නිලධාරීන්ගේ ලද උපදෙස් අනුව 2018 දෙසැම්බර් 31 දිනට වාර්තා නොවූ රු.10,968,825 ක් වටිනා වත්කම් ආරම්භක ශේෂ ලෙස නැවත දත්ත පද්ධතියට ඇතුලත් කර ඇත.<br>මෙම නිවැරදි කිරීම් පිළිබඳව අදාල පැහැදිලි කිරීමක් 2019 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ලබා දෙනු ලබන ACA 6 ආකෘතියේ නිශ්චිත ගැලපීම් කිරීම සඳහා තීරුවක් නොතිබුණි. එබැවින් 2018 වර්ෂයට අදාලව අවසාන ශේෂය 2019 ජනවාරි 01 දිනට වූ ඉහත දත්ත ඇතුලත් කිරීම් ගලපන ලද ශේෂය රු. 39,593,266.53 ශේෂය ලෙස අවසාන ගිණුම් සඳහා ඇතුලත් කරන ලද බව කාරුණිකව සලකන්න. |

## 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍ර අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල ආදායම් නොවන ලැබීම් හා අග්‍රිම ලැබීම් වෙන වෙනම පෙන්විය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල ආදායම් නොවන ලැබීම් හා අග්‍රිම ලැබීම් ඒ.සී.ඒ. 3 ආකෘතියෙහි වෙන වෙනම පෙන්වා ඇත. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයට මූල්‍ය ක්‍රියාකාරකම් මඟින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ගැලපූ පසු අගය සෘණ රු.5,998,478 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් වල ශුද්ධ වෙනස්වීම ශුන්‍ය ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව හා නිවැරදි වටිනාකම් ඇතුලත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. | මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) හා මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ) යන ශේෂයන් දෙකම සෘණ අගයක් පෙන්නුම් කරන බැවින් ((-උ)-(-ඒ))=0 ලෙස දක්වා ඇත. |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ඒකාබද්ධ ශේෂ පිරික්සුම සමඟ සැසඳීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වූ මුදල් ලැබීම්වල ඇතුලත් වෙනත් ලැබීම්වල රු.5,664,694 ක වෙනසක්ද, මුදල් වැයකිරීම්වල රු. 54,396,593 ක වෙනසක්ද, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වූ මුදල් ලැබීම් වල රු.38,070,753 ක වෙනසක්ද, මුදල් වැය කිරීම් වල රු.29,373,284 ක වෙනසක්ද, මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වූ මුදල් ලැබීම් වලරු.18,060,612 ක වෙනසක්ද, මුදල් වැය කිරීම් වල රු.19,444,884 ක්ද | නිවැරදි වටිනාකම් ඇතුලත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම හා සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන විගණනය වෙත නොපමාව ඉදිරිපත් කළ යුතුවීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමේදී ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි තොරතුරු සැලකිල්ලට ගත නොහැක. එය සැකසී ඇත්තේ 104 හා 149 යන වැය ශීර්ෂයන් දෙකටම අදාල වියදම්, ආදායම්, තැන්පතු |

| | | |
|---|---|---|
| වශයෙන් වෙනස්කම් නිරීක්ෂණය විය. එම වෙනස්කම් වලට හේතු පරීක්ෂා කිරීමට අවශ්‍ය විස්තරාත්මක උපලේඛනද විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | | ඇතුලත් වී ඇත. නමුත් අනෙකුත් ලැබීම් ඇතුලත් වියදම් ආකෘතියෙහිද පෙන්වා ඇත. ආයෝජන ක්‍රියාකාරකම් වලට අදාල වියදම් ACA ආකෘතියෙහි මුදල් පොතට අනුව වියදම සලකිල්ලට ගෙන සකසා ඇත. |

### 1.6.5 අක්මුදල් ගැලපුම් ගිණුම

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ------------ | --------------------- |
| (අ) අක් මුදල් ගැලපුම් ගිණුම පිළියෙල කිරීමේදී මුදල් රෙගුලාසි 208 යටතේ වෙනත් අමාත්‍යාංශ ප්‍රධාන ලෙජරය දරන වියදම් භාණ්ඩාගාර පොත් අනුව රු.2,836,242,553 ක් විය යුතු වුවද එය රු.2,834,819,802 ක් වශයෙන් රු.1,422,751 ක් අඩුවෙන් බැර කර තිබුණි. එමෙන්ම මුදල් රෙගුලාසි 208 යටතේ වෙනත් අමාත්‍යාංශ වෙනුවෙන් දරන ලද වියදම භාණ්ඩාගාර පොත් අනුව රු.1,535,647,608 ක් වුවද අක් මුදල් ගැලපුම් ගිණුමේ එය රු.1,521,382,362 ක් ලෙස රු.14,265,247 ක් අඩුවෙන් හර කර තිබුණි. | අක් මුදල් ගැලපුම් ගිණුම නිවැරදි වටිනාකම් ඇතුලත් කර පිළියෙල කළ යුතු වීම. | අක් මුදල් ගැලපුම් ගිණුම් සැකසීමේදී 149 වැය ශීර්ෂයට අදාල වියදම්, තැන්පතු, අත්තිකාරම, ආදායම් ශේෂයන් සැලකිල්ලට ගෙන සකසා ඇත. එම තොරතුරු ACA 2(II), ACA 3 ,4, 5 වල ඇතුලත් කරුණු පදනම් කරගෙන ලබා ගෙන ඇත. |
| (ආ) අක් මුදල් ගැලපුම් ගිණුම තුල අත්තිකාරම් වශයෙන් බැර කල වටිනාකම භාණ්ඩාගාර පොත් අනුව සැසඳීමේදී රු.13,024,902 ක් විය යුතු වුවද එය ගැලපුම් ගිණුමෙහි රු.6,272,051 ක් ලෙස එනම් රු.6,752,851 ක් අඩුවෙන් බැර කර තිබුණි. එමෙන්ම අත්තිකාරම් වශයෙන් ගැලපුම් ගිණුමෙහි හරකල වටිනාකම භාණ්ඩාගාර පොත් අනුව සැසඳීමේදී | -එම - | - එම - |

| | | |
|---|---|---|
| රු.10,306,113 ක් විය යුතු වුවද එය රු.25,045,851 ක් ලෙස එනම් රු.14,739,738 ක් වැඩියෙන් හර කර තිබුණි. | | |
| (ඇ) අක් මුදල් ගැලපුම් ගිණුමට තැන්පතු ලෙස බැර කර තිබුණු වටිනාකම රු.13,890,699 ක් වුවද අමාත්‍යාංශ පොත් හා භාණ්ඩාගාර පොත් සැසදීමේදී එම වටිනාකම රු.3,401,657 විය. එනම් ගැලපුම් ගිණුමට රු.10,489,042 ක් වැඩියෙන් බැර කර තිබුණි. එමෙන්ම ගැලපුම් ගිණුමට හර කල යුතු වටිනාකම, අමාත්‍යාංශ පොත් හා භාණ්ඩාගාර පොත් සැසදීමේදී රු.5,384,188 ක් විය යුතු වුවද ගැලපුම් ගිණුමෙහි එය රු.14,528,955 ක් ලෙස එනම් රු.9,144,767ක් වැඩියෙන් හර කර තිබුණි. | -එම - | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| වැඩ තහනමට ලක්වූ නිලධාරියෙකුගේ නොපියවූ රු. 100,208 ක් වූ ණය ශේෂය සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විට වසර 10 කට වැඩිකාලයක් ඉක්මවා තිබුණද එම ණය අයකර ගැනීමට නොහැකිව තිබුණි. | ණය අයකර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතු වීම. | මෙම මුදල අයකරගැනීම සඳහා කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති බවත් එම නිලධාරියා දෙවරක් අධිකරණයේ පෙනී නොසිටීම හේතුවෙන් ඔහුට වරෙන්තු නිකුත් වී ඇති බවත් නඩුව තාවකාලිකව බහා තබා ඇති බව. |

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| (අ) අමාත්‍යාංශයට අදාල වැය ශීර්ෂය යටතේ වැඩ සටහන් 01 හි වැය විෂයයන් 17 ක් සඳහා මු.රෙ.66/69 යටතේ රු. 71,450,000 ක් ද , වැය විෂයයන් 01 ක් සඳහා පරිපූරක ප්‍රතිපාදන යටතේ රු. 16,000,000 ක් ද වැඩ සටහන් 02 හි වැය විෂයයන් 10 ක් සඳහා මු.රෙ.66/69 යටතේ යටතේ රු. 145,150,000 ක් ද වැය විෂයයන් 05 ක් සඳහා පරිපූරක ප්‍රතිපාදන යටතේ රු. 3,043,990,000 ක්ද වශයෙන් එකතුව රු. 3,276,590,000 ක අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. මෙම අගය මෙම වැය ශීර්ෂය යටතේ වූ මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනය වන රු. 12,439,000,000 න් සියයට 26 ක් විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | අමාත්‍යාංශය විසින් 2019 වසර සඳහා සකස් කර ඉදිරිපත් කරන ලද අයවැය ඇස්තමේන්තුවේ සමහර වැය විෂයයන් සඳහා ඉල්ලා තිබූ ප්‍රතිපාදන ප්‍රමාණයන් එලෙසින්ම ලබා දී නොතිබිණි. එබැවින් වර්ෂය තුල ගෙවීම් කටයුතු සිදු කිරීමේදී ඇතිවූ ඌනතාවයන් සඳහා ඒ ඒ වැය විෂයන්ට අදාල ප්‍රතිපාදනයන් මු.රෙ.66 මාරු පත්‍ර මගින් සලසා ගන්නා ලෙස අයවැය දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති අතර මු.රෙ. 66 මාරු කිරීම් මගින් අදාල අවශ්‍යතා සපුරා ගන්නා ලදී.තවද, අමාත්‍ය මණ්ඩල සංදේශ මගින් අනුමත කරන ලද, වැඩසටහන් අංක 01 හි වැය විෂයයන් 01ක් සහ වැඩසටහන් අංක 02 හි වැය විෂයයන් 05ක් සඳහා වැය ශීර්ෂ 149 යටතේ විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා පරිපූරක ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. ඒ අනුව එකී පරිපූරක ප්‍රතිපාදනයන් වැය විෂයයන් යටතේ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සලසා දී තිබිණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැඩ සටහන් 01 හි වැය විෂයයන් 19 ක් සඳහා රු. 71,450,000 ක් සහ වැඩ සටහන් 02 හි වැය විෂයයන් 06 ක් සඳහා රු.145,150,000 ක් වශයෙන් රු. 216,600,000 ක් මු.රෙ.66/69 යටතේ යටතේ ප්‍රතිපාදන අඩුකර තිබුණි. එය එක් එක් වැය විෂයයේ ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 2 සිට සියයට 95 ක් වන පරාසයක් දක්වා ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | 2019 වසර සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන මනා ලෙස කළමණාකරනය කර ගැනීම හා අපේක්ෂිත වියදම් සීමා කිරීම මත ඇතැම් වැය විෂයයන්හි ඉතිරි කරගත් ප්‍රතිපාදන කොටසක් අනෙකුත් වැය විෂයයන් වෙත මාරු කර ගැනීම මගින් අත්‍යාවශ්‍ය වියදම් දැරීම සඳහා කටයුතු සලසා ගන්නා ලදී. |
| (ඇ) | වැය විෂයයන් 12 ක් සඳහා සලසා තිබුණු රු. 1,699,750,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | වියදම් කළමනාකරණය, UNIDO ආයතනයට සාමාජික ගාස්තු ගෙවීම් ඉල්ලුම්පත් ඉදිරිපත් නොවීම,සමූපකාර අංශයේ ණය කපා හැරීම් සඳහා බිල්පත් ඉදිරිපත් නොවීම,අයවැය චක්‍රලේඛ 07/2019 සහ 09/2019 ප්‍රකාරව කටයුතු කිරිම,විශ්‍රාමික ප්‍රතිලාභ ලබා ගන්නා නිලධාරීන් නොමැතිවීම,05/2019 චක්‍ර ලේඛය අනුව වියදම් කළමනාකරණය කිරීම. |
| (ඇ) | වැය ශිර්ෂය යටතේ වැඩ සටහන් 01 හි හා 02 හි වැය විෂයයන් 38 ක් සඳහා රු. 6,761,509,203 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 31 සිට සියයට 97 අතර පරාසයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. | වියදම් කළමනාකරනය කිරීම හා ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම, පුරප්පාඩු පැවතීම, ප්‍රතිලාභ ලබා ගන්නා නිලධාරීන් සීමා වීම, දේපළ ණය ලබා ගැනීම් සීමා වීම, ව්‍යාපෘති මගින් බැංකු හරහා ව්‍යාපාර වෙත ණය මුදල් ලබා දුන්නද එම ණය ප්‍රතිපූර්ණය කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි අක්මුදල් නිදහස් කර නොමැති වීම. |
| (ඉ) | පරිපූරක ඇස්තමේන්තු මඟින් නව වැය විෂයය අංකයක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ලබාගෙන තිබුණු | කර්මාන්තපුර ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කල යුතු | කර්මාන්තපුර 7 ක් ස්ථාපනය කිරිමට සැලසුම් කළද කර්මාන්තපුර 5 ක් |

| | | | |
|---|---|---|---|
| | රු. 1,000,000,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | වීම. | සඳහා නීත්‍යානුකූල ඉඩම් නිදහස් කර ගැනීමට නොහැකි වීම,එක් කර්මාන්තපුරයක් සඳහා සුදුසු ඉඩමක් සොයා ගත නොහැකි වීම හා එක් කර්මාන්තපුරයක තුන්වන අදියර යටතේ ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට ප්‍රසම්පාදන කටයුතු අවසන් කර නොතිබීම. |
| (ඊ) | වැය විෂයයන්හි ඉතිරිකිරීම් වලට හේතු ලෙස අයවැය චක්‍රලේඛ අංක 05/2019 හා 07/2019 අනුව කටයුතු කල බව මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණද සත්‍ය වශයෙන් මෙම චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කර නොතිබුණි. එම නිසා වැය විෂයයන් 4කට අදාලව ඉතිරිය ඉක්මවූ රු. 329,192,769 ක්වූ බැරකම් වලට එලඹ තිබුණි. | චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කල යුතු වීම. | ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා පේෂකර්ම දෙපාර්තමේන්තුවට වර්ෂය තුල ප්‍රතිපාදන ලබා දී ඇති අතර වර්ෂ අවසානයේදී CIGAS මගින් සෘජුවම භාණ්ඩාගාරයට වියදම් වාර්තා කර ඇත. |
| (උ) | අංක 149-2-3-34-2001 වැය විෂයය සඳහා වූ රු. 225,000,000 ක් වූ ප්‍රතිපාදනය සියයට 100 ක ඉතිරිවීම් ලෙස දක්වා තිබුණද එම වැය විෂයයට අදාලව රු.34,774,233 ක බැරකම් තිබුණි. | නිවැරදි තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවීම. | සමූපකාර තොග වෙළඳ සංස්ථාව යටතේ ගොඩනැගිල්ලක් ඉදි කිරීම ආරම්භ කිරීමේදී වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවීම සඳහා වවුචර්පත් ඉදිරිපත් කර තිබුණි. එම වවුචර්පත් වටිනාකම බැදීම් ලෙස වාර්තා වී ඇත. |
| (ඌ) | වැය විෂයයන් 03 ක් සඳහා මු.රෙ.66 යටතේ රු. 175,000,000 ක අමතර ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණද එම මාරුකර ගත් සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි. | නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. | 5/2019 හා 7/2019 අයවැය චක්‍රලේඛ අනුව වියදම් සීමා කිරීමට සිදුවීම. |

| | | | |
|---|---|---|---|
| (එ) | විදුලිය, ජලය, දුරකථන වියදම්, කාර්යාල උපකරණ මිලදී ගැනීම් සහ දේශීය හා විදේශීය ගමන් වියදම් අරපිරිමැසුම් සහිතව කළමනාකරණය කල යුතු බව 2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 අයවැය චක්‍රලේඛය මඟින් දක්වා තිබුණද වැය විෂයයන් 03ක් සඳහා චක්‍රලේඛ දිනයට පසුව මු.රෙ. 66 මඟින් රු. 1,800,000 ප්‍රතිපාදන මාරුකර ගෙන තිබුණි. | චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කල යුතු වීම. | 2019/12/04 දිනැති 7/2019 චක්‍රලේඛය මගින් වියදම් කළමනාකරණය කල යුතු බව දක්වා තිබුනද, චක්‍රලේඛ දිනට පෙර, පසුව ගෙවීමේ පදනම මත දැරූ අත්‍යාවශ්‍ය වියදම් (ගමන් වියදම්, ලිපි ද්‍රව්‍ය) පියවීම සඳහා පවත්නා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. |

**2.2 බැරකම් හා බැඳීම් වලට එළඹීම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------- | ---------------- | ----------------------- |
| (අ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව යම් මුදල් වර්ෂයකට අදාල සියළුම බැරකම් එම වර්ෂය තුලදී මුදල් ගෙවා නිදහස් කල යුතු අතර කිසිදු බැරකමක් ඊලඟ වර්ෂය තුල නිරවුල් කිරීමේ අරමුණු ඇතිව ඉදිරියට ගෙන නොයා යුතුය. එහෙත් අමාත්‍යාංශය විසින් 2019 දෙසැම්බර් 31 දිනට රු.1,950,827,981 ක බැරකම් ඇති කරගෙන තිබුණි. | චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කල යුතු වීම. | භාණ්ඩාගාරය විසින් ප්‍රමාණවත් අක්මුදල් ලබාදී නොතිබූ බැවින් විවිධ ව්‍යාපෘති වෙනුවෙන් දරණ ලද වියදම් වර්ෂ අවසානයේදී නිරවුල් කල නොහැකි විය. දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දී තිබූ ප්‍රතිපාදනයන්ට අදාලව බැරකම් CIGAS වැඩසටහන යටතේ සෘජුව භාණ්ඩාගාරයට වාර්තා කර ඇත. |
| (ආ) | වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරිවූ එකතුව රු.252,225,872 ක ප්‍රතිපාදනය රු.355,866,545 කින් ඉක්මවා රු.608,092,417 ක බැරකම්වලට එළඹ තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති බැරකම් හා බැරකම් ලේඛණයේ දක්වා ඇති බැරකම් එකිනෙක සසඳා නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. | 2018 වර්ෂයේ බැරකම් ඉදිරියට ගෙන ඒම මගින් මෙම ශේෂ ඇතිවී ඇති අතර 2019 වර්ෂයේ ප්‍රතිපාදන ඉක්මවා බැරකම් නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වසර සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී ව්‍යාපෘති 23 ක් සඳහා කිසිදු භෞතික ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණු අතර, ව්‍යාපෘති 02 ක සියයට එකක පමණ ප්‍රගතියක් අත්පත් කරගෙන තිබුණි. ඒ අනුව ඉහත ව්‍යාපෘති 25 වෙනුවෙන් වෙන්කරන ලද සමස්ථ ප්‍රතිපාදනය වූ රු. මිලියන 212.74 න් රු. මිලියන 199.48 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු එවා නැත. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අමාත්‍යාංශය විසින් මන්නාරම කර්මාන්තපුරය තුල යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් 2019 ජුනි 30 වන විට රු.මිලියන 306.96 ක වියදමක් දරා තිබුණද 2019 ඔක්තෝබර් 15 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී එහි | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතු අතර වැඩ අවසන් | පිළිතුරු එවා නැත. |

| | | |
|---|---|---|
| එකඳු කර්මාන්තශාලාවක් හෝ ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. තවද කර්මාන්තපුරය තුල ආයෝජකයන් වෙනුවෙන් රු.මිලියන 100.05 ක පිරිවැයක් දරා අමාත්‍යාංශය විසින් එක් ගොඩනැගිල්ලක් වර්ග අඩි 20,000 බැගින් වූ කර්මාන්තශාලා ගොඩනැගිලි 02 ක් ඉදිකර තිබුණු අතර එහි ආයෝජනය කිරීමට මෙතෙක් ආයෝජකයෙකු ඉදිරිපත් නොවීම නිසා එම ගොඩනැගිලි නිෂ්කාර්යව පවතුණි. | කරන ලද ගොඩනැගිලි අදාල අරමුණු ඉටුකර ගැනීම සඳහා භාවිතා කළ යුතුය. | |
| (ආ) වැලිඔය කර්මාන්තපුරයෙහි කර්මාන්ත සඳහා වෙන්කර ඇති භූමි ප්‍රමාණය අක්කර 40 ක් වූ අතර අමාත්‍යාංශය විසින් ඒ සඳහා දරා තිබුණු සමස්ථ වියදම රු. මිලියන 256.94 ක් විය. 2019 දෙසැම්බර් 31 දිනට කිසිදු කර්මාන්තයක් ස්ථාපිත කර නොතිබුණි. අමාත්‍යාංශය විසින් 2019 වර්ෂය වන විට රු. මිලියන 178.78 ක වියදමක් දරා කර්මාන්තශාලා, ගොඩනැගිලි 03 ක් ඉදිකර තිබුණද එම ගොඩනැගිලි තුල කර්මාන්ත ආරම්භ කිරීමට කිසිදු ආයෝජකයෙකු ඉදිරිපත් වී නොතිබුණෙන් එම ගොඩනැගිලි නිෂ්කාර්යව පැවතුණි. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ අතර වැඩ අවසන් කරන ලද ගොඩනැගිලි අදාල අරමුණු ඉටු කර ගැනීම සඳහා භාවිතා කළ යුතුය. | පිළිතුරු එවා නැත. |

**3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුසලි ඇගළුම් හා ඒ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධන ව්‍යාපෘතියේ මූලික කටයුතු වෙනුවෙන් 2015 වර්ෂයේදී පාර්ශවයන් 3 කට රු. මිලියන 167.9 ක් ගෙවා තිබුණද ඉඩම් අත්කර ගැනීම සම්බන්ධ ගැටළු හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබූ අතර 2020 ජුලි 01 දින වන විටත් එම මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කල යුතු වීම හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු වීම. | විකල්ප ඇගළුම් හා ඒ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධන ව්‍යාපෘතියක මූලික කටයුතු මෙම ආයතන වලින් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වේ. |

## 3.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ඉහත කර්මාන්තපුර 17 ක් තුල කර්මාන්තපුර සඳහා වෙන්කර ඇති මුළු භූමි ප්‍රමාණය වූ අක්කර 634.92 න් අක්කර 235.58 ක් 2019 ජුනි 30 දින වන විට භාවිතයට ගෙන නොතිබුණි.එය මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 37 ක් විය. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු එවා නැත. |

## 3.5 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තියට අනුව සෑම ආස්ථිතායක් විසින්ම එහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවද විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උපවගන්තියට අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවද විගණනය සඳහා ඉදිරිපත් කළයුතුය. | මෙම වාර්තාව සකස් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර කඩිනමින් එම වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | “නංවමු ලංකා” ව්‍යාපෘතියට අදාල වූ බැරකම් වටිනාකම රු.136,160,833 ක් වූ අතර බැඳීම් වටිනාකම රු.4,324,470 ක් විය. මෙම බැරකම් හා බැඳීම් වටිනාකම ඇතිවෙන ලද්දේ කුමන වියදම් සම්බන්ධයෙන්ද වන තොරතුරු 2020 ජුනි 30 දින වන විටත් අමාත්‍යාංශය සතුව නොතිබුණි. | ජාතික මෙහෙයුම් කමිටුව ව්‍යාපෘතියට අදාල කටයුතු සඳහා සමාලෝචනයන් හා මඟපෙන්වීම් කල යුතු වීම. | පිළිතුරු එවා නැත. |
| (ආ) | අමාත්‍යාංශයේ වැය ලෙජරය අනුව “නංවමු ලංකා” ජාතික ව්‍යවසාය සංවර්ධන වැඩසටහන සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක් වෙත යවන ලද ප්‍රතිපාදන වලින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 10 ක් විසින් රු. 34,091,061 ක වියදමක් දරා තිබුණද ප්‍රගති වාර්තා අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල 04 ක් පමණක් නංවමු ලංකා වැඩසටහන සඳහා උපකරණ මිලදී ගෙන තිබුණි. ඉතිරි දිස්ත්‍රික් ලේකම් කාර්යාල 06 විසින් රු.1,722,014 ක වියදමක් දරා තිබුණද එම වියදම් මොනවාද යන්න හඳුනාගෙන නොතිබුණි. | ජාතික මෙහෙයුම් කමිටුව ව්‍යාපෘතියට අදාල කටයුතු සඳහා සමාලෝචනයන් හා මඟපෙන්වීම් කල යුතු වීම. | පිළිතුරු එවා නැත. |

**4.** **තිරසර සංවර්ධනය**

-----------------------

**4.1** **තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

-------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------- | ------------------------ |
| අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගනිමින් පැවති අතර ඒ යටතේ වන පාදක දර්ශක හඳුනා ගැනීම හා දත්ත රැස්කිරීම හා ගබඩා කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු පමණක් සිදුකෙරෙමින් පැවතුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ලඟාකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | පිළිතුරු එවා නැත. |